## ප්‍රස්තාවනාව.

"ශ්‍රී ලංකාවේ මූල්‍ය ප්‍රතිපත්ති කාර්යක්ෂමතාව" නම් වූ මෙම පර්යේෂණ නිබන්ධය රුහුණ විශ්ව විද්‍යාලයේ ආර්ථික විද්‍යා දර්ශනපති උපාධිය සඳහා ඉදිරිපත් කරන්නකි.

මිල ස්ථායීකරණය, ආර්ථික වර්ධනය, ආදායම් ප්‍රතිවයාප්තිය, ඉහළ සේවා නියුක්ති මට්ටමක් අත් පත් කර ගැනීම, වැනි රාජ්‍ය සාර්ව ආර්ථික අරමුණු ඉටු කර ගැනීම සඳහා රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති (Fiscal Policies)මූල්‍ය ප්‍රතිපත්ති (Monetary Policies ), විනිමය අනුපාතික ප්‍රතිපත්ති (Exchange Rate Policies) අදාළ පරිදි භාවිත කළ හැකි ය. රාජ්‍ය සාර්ව ආර්ථික අරමුණු ඉටු කර ගැනීමේ දී මූල්‍ය ප්‍රතිපත්ති භාවිතය හා ඒවායේ කාර්යක්ෂමතාව පිළිබඳ මත වාදවලට සැලකිය යුතු ඉතිහාසයක් ඇත. සියවස් දෙකකට මදක් වැඩි කාලයක් තුළ විවිධ න්‍යායාචාර්ය--වරුන් හා ඔවුන්ගේ අනුගාමිකයන් ගෙන් සැදුම් ලත් කණ්ඩායම්වල අදහස් උදහස් ඔස්සේ මෙම ක්ෂේත්‍රය පුළුල් ලෙස විවාදවලට පාත්‍ර වී ඇත.

මූල්‍ය ප්‍රතිපත්තිවලින් අපේක්ෂා කරන්නේ කෙටි කාලීන ආර්ථික ස්ථායිතාව හා දිගු කාලීන ආර්ථික වෘද්ධිය අත් පත් කර ගැනීමට යෝග්‍ය ආකාරයට සමස්ත ඉල්ලුමේ වර්ධනය පවත්වා ගෙන යාම සඳහා මුදල් සැපයුම සහ ණය මුදල් පිරිවැය අවශ්‍ය පරිදි හැසිරවීම ය.

මහ බැංකු ක්‍රමයක් ක්‍රියාත්මක වන රටවල මූල්‍ය ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීමේ වගකීම රජය විසින් මහ බැංකුව වෙත පවරනු ලැබ ඇත. ඒ අනුව මහ බැංකුව රජයට සම්බන්ධ ආයතනයක් ලෙස ක්‍රියාත්මක වන නිසා රාජ්‍ය ආර්ථික අරමුණු වෙනස් වන ආකාරයට මහ බැංකු මූල්‍ය ප්‍රතිපත්තියේ අරමුණු ද වෙනස් වේ.

මෙම අධ්‍යයනය සඳහා 1970-1985 කාල පරිච්ඡේදය තෝරා ගෙන ඇත්තේ විශේෂ හේතුවක් නිසා ය. මෙම කාලය, 1977 වර්ෂය කඩ ඉමක් ලෙස ගෙන කොටස් දෙකකට වෙන් කළ හැකි ය. 1970-1977 කාලය තුළ අවෘත ආර්ථික

ප්‍රතිපත්තියක් යටතේ, ආනයන ආදේශන කාර්මීකරණයක් මගින් යාර්ව ආර්ථික අරමුණු ඉටු කර ගැනීමට තැත් කර ඇති අතර, 1977–1985 කාලය තුළ විවෘත ආර්ථික ප්‍රතිපත්තියක් යටතේ අපනයන ප්‍රවර්ධන කාර්මීකරණයක් මගින් එම අරමුණු ඉටු කර ගැනීමට උත්සාහ කර ඇත.

එකිනෙකට වෙනස් ආර්ථික ප්‍රතිපත්ති රාමු දෙකක් තුළ මූල්‍ය ප්‍රතිපත්ති භාවිත කර ඇති ආකාරයත්, මූල්‍ය පාලන උපකරණ තෝරා ගෙන ඇති ආකාරයත්, ඒවායේ සාපේක්ෂ කාර්යක්ෂමතාව හා බලපෑ ඇති සාධක පරීක්ෂා කිරීමත්, ඉතා වැදගත් වේ.

1970–1985 කාල පරිච්ඡේදය පිළිබඳව විශේෂ අවධානයක් යොමු කළ ද, පොදුවේ සංවර්ධනය වන රටවල මූල්‍ය ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීමේ දී හා මූල්‍ය පාලන උපකරණ භාවිත කිරීමේ දී මුහුණ දීමට සිදු වන දුෂ්කරතා මෙහි දී විමසුමට ලක් කර ඇත.

මෙම අධ්‍යයනය සඳහා බොහෝ දුරට ද්විතියික දත්ත භාවිත කර ඇත. ශ්‍රී ලංකාවේ ආර්ථික ක්‍රියාකාරිත්වය හා මූල්‍ය ප්‍රතිපත්ති පිළිබඳ ව දත්ත ලබා ගත හැකි දැනට තිබෙන හොඳ ම මූලාශ්‍රය ශ්‍රී ලංකා මහ බැංකුව ය. ඊට අමතර ව ජන ලේඛන හා සංඛ්‍යා ලේඛන දෙපාර්තමේන්තුව විසින් ප්‍රකාශයට පත් කර ඇති දත්ත ද මෙහි දී භාවිත කර ඇත.

මෙම අධ්‍යයනය සඳහා පර්යේෂණ කටයුතු කරන ලද්දේ කිසිදු අධ්‍යයන නිවාඩුවකින් තොර අවිවේකී පරිසරයක් තුළ ය. පර්යේෂණ මාතෘකාව තෝරා දීමෙන් ද, පර්යේෂණ ප්‍රගතිය නිරන්තර ව සොයා බැලීමෙන් ද, ගැටලු නිරාකරණය කර දීමෙන් ද, මා නිසි මගට යොමු කිරීම සඳහා තමාගේ වටිනා කාලය හා ශ්‍රමය කැප කළ රුහුණ විශ්ව විද්‍යාලයේ මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා පීඨයේ පීඨාධිපති ආර්ථික විද්‍යාව පිළිබඳ මහාචාර්ය ඩැනී අතපත්තු මහතාට මගේ භක්ති පූර්වක ස්තුතිය ප්‍රථමයෙන් පිරිනැමේ.

නිබන්ධයේ අත් පිටපත හොඳින් කියවා ව්‍යාකරණ හා අනෙකුත් වැරදි යෙදුම් නිවැරදි කර දුන් රුහුණ විශ්ව විද්‍යාලයේ සිංහල අධ්‍යයන අංශයේ ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය ශාස්ත්‍රපති පණ්ඩිත අඟුලුගහ ධම්මින්ද ස්වාමීන් වහන්සේ ද, විශ්‍රාම ලත් විදුහල්පති ඩී. ගුණදාස බටගොඩ මහතා ද, විශ්‍රාම ලත් පාඨශාලාචාර්ය දෙවිනුවර ඩබ්ලිව්. එස්. සිරිසේන මහතා ද, ඡායා පිටපත් ලබා ගැනීමට පහසුකම් සපයා දුන් රුහුණ විශ්ව විද්‍යාලයේ සිංහල අධ්‍යයන අංශ ප්‍රධාන හා ප්‍රධාන ශිෂ්‍ය උපදේශක ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය පුංචි බණ්ඩා ඒකනායක මහතා ද, නන් අයුරින් උපකාර කළ මාතර රෝහණ මහා විද්‍යාලයේ විදුහල්පති රත්නසිරි සුරවීර මහතා ද, රුහුණ විශ්ව විද්‍යාලයේ ආර්ථික විද්‍යා අංශ ප්‍රධාන ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය දයානන්ද පටබැඳි මහතා ද, කෘතඥ පූර්වක ව සිහිපත් කරමි.